Library Copy (16)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019-05-21

පැමිණිලිකරු - ටී.එච්.කරුණාදාස මයා,
නො : 29/ඩී, පිටියදේවාල පාර,
ධර්මාශෝක මාවත,
අරුප්පල, මහනුවර.

වගඋත්තරකරුවන් - 01. අධ්‍යක්ෂ - වැටුප් හා ලේඛන,
යුධ හමුදා මූලස්ථානය,
කොළඹ 03.

02. යුධ හමුදාපති,
යුධ හමුදා මූලස්ථානය,
කොළඹ 03.

**<u>පැමිණිලි අංක : HRC/K/385/15</u>**

**පැමිණිල්ලෙන් ඉදිරිපත් කරන කරුණු හා ඉල්ලා සිටින සහනයන් :-**

විශ්‍රාමික යුධ හමුදා නිලධාරියෙකු වන මෙම පැමිණිලිකරු ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී 1999.08.09 දින LTTE මරාගෙන මැරෙන බෝම්බකරුවෙකුගේ ප්‍රහාරයකට ලක්ව තුවාල ලැබීම හේතුවෙන් 2007.03.26 දින වෛද්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරිමෙන් පසු දුබලතා ප්‍රතිශතය 40% ක් ලෙස නිගමනය කර රු.40,000 ක වන්දියක් හා ඊට අදාළ දුබලතා විශ්‍රාම වැටුපක් හිමිකර දී 2007.06.21 දින විශ්‍රාම ගන්වා ඇත.

එලෙස විශ්‍රාම ගොස් සිටියදී ඉහත රෝගි තත්ත්වය නිසා පසුකාලීනව තමාට ඇතිවූ ශාරීරික දුබලතා හේතුවෙන් මෙහි 2 වන වගඋත්තරකරු වන යුධ හමුදාපති වෙත ඉදිරිපත් කළ අභියාචනයක් පරිදි 2014.03.04 දින නැවත වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීමෙන් පසු එම දුබලතා ප්‍රතිශතය 60% ක් දක්වා ඉහළ දමා ඇත. එබැවින් දෙවන වෛද්‍ය මණ්ඩල නිර්දේශය අනුව හිමිවිය යුතු හිඟ දුබලතා වන්දි ගෙවීම් හා ඊට අදාළ හිඟ දුබලතා විශ්‍රාම වැටුප මෙහි පළමු වගඋත්තරකාර පාර්ශවය වන අධ්‍යක්ෂ -



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

වැටුප් හා ලේඛන විසින් මේ වනතෙක් සකස් කර නොමැති බැවින් එම හිමිකම් ලබාදෙන ලෙස පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටි.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම ඃ-

- වැටුප් හා ලේඛන අධ්‍යක්ෂකගේ කරුණු දැක්වීම ඃ-

ඉහත වගඋත්තරකරු විසින් කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, මෙම විශ්‍රාමික නිලධාරී නිලයේ රැඳි සිටිය හැකි උපරිම වයස් සීමාව අවු ඃ 55 සම්පූර්ණවීම හේතුවෙන් 2007.06.21 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගන්වා ඇති බවත්, විශ්‍රාම ගන්වන අවස්ථාවේදී මෙම නිලධාරි ත්‍රස්ථවාදි ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව සිටි බැවින් වෛද්‍ය මණ්ඩලයක් හමුවට ඉදිරිපත් කිරීමෙන් පසු 40% දුබලතා ප්‍රතිශතයක් මත වයස අවු ඃ 55 වන තෙක් වැටුප් හා දීමනා හිමි ගැන්වීමට වෛද්‍ය මණ්ඩලය නිර්දේශ කර ඇති බවත් සඳහන් කර ඇත. එසේ වුවද මෙම නිලධාරි විශ්‍රාම ගන්වන අවස්ථාවේදී වයස අවුරුදු 55 ඉක්මවා සිටි බැවින් වැටුප් හා දීමනා හිමි ගැන්වීමට පවතින විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැති අතර, ආබාධිත ප්‍රතිශතය අනුව රු.40,000/-ක වන්දි මුදලක් හා ඊට අදාළ වැටුප් හිමිකම් හිමි ගන්වා ඇති බවද දක්වා ඇත.

පසුව මෙම විශ්‍රාමික නිලධාරියා 2014.03.04 වන දින දෙවන වරට වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් වී ඇති අතර, එහිදි ඔහුගේ දුබලතා ප්‍රතිශතය 60% ක් වශයෙන් වැඩිකර වන්දි මුදල් හා දීමනා සහිතව වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා හිමි ගැන්වීමට වෛද්‍ය මණ්ඩලය නිර්දේශ කර ඇති බවද දක්වා ඇත.

එහෙත් ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව වෛද්‍ය මණ්ඩල නිර්දේශ මත විශ්‍රාම ගන්නා යුද්ධ හමුදා සාමාජිකයන්ට වැටුප් හා දීමනා හිමි ගැන්විය හැක්කේ වයස අවුරුදු 55 දක්වා පමණක් වන බැවින් හා ප්‍රථමයෙන් පවත්වන ලද වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කර ස්ථිර දුබලතා ප්‍රතිශතයක් මත වන්දි හා දීමනා හිමි ගැන්වූ වයස අවුරුදු 55 ඉක්මවන ලද නිලධාරියෙකු වෙත නැවත වන්දි/වැටුප් හා දීමනා හිමි ගැන්වීමට දැනට පවතින විධිවිධාන ප්‍රකාරව ඉඩ ප්‍රස්ථාව සැලසී නොමැති බව සඳහන් කර ඇත. එසේම හුදෙක්ම මෙම නිලධාරි විසින් කරන ලද ඉල්ලීමකට අනුව නැවත වෛද්‍ය මණ්ඩලයක් වෙත පමුණුවා 60% ක දුබලතා ප්‍රතිශතයක් යටතේ අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීමට වෛද්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇතත් එහිදි මෙම නිලධාරියාගේ වයස පිළිබඳව සැලකිළිමත් වී නොමැති බව පෙනී යන බවද දන්වා ඇත. ඒ අනුව තමන්ට ක්‍රියාකළ හැක්කේ විශ්‍රාම ගන්වන අවස්ථාවේදි ලබාදී තිබූ 40% ක දුබලතා ප්‍රතිශතය මත පමණක් බවත් 60% ක දෙවන වර වැඩිකළ දුබලතා ප්‍රතිශතය අනුව දුබලතා විශ්‍රාම වැටුප් හා වන්දි මුදල් හිමි ගැන්වීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බවත් දන්වා ඇත.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2015.11.03 දිනැතිව 2015.11.18 දිනට ප්‍රථම මෙම පැමිණිල්ලට අදාළව වාර්තා කැඳවා ඇතත් යුධ හමුදාපති වාර්තාවක් ඉදිරිපත් කර නොමැත. නැවත 2015.11.30 දිනැතිව 2015.12.15 ට පෙර වාර්තාවක් එවන ලෙසට දැනුම්දී ඇතත් ඒ සඳහාද ප්‍රතිචාර දක්වා නොමැත.

**විමර්ශනය හා නිගමනය ඃ-**

මෙහි පැමිණිලි පාර්ශවය 1999.08.09 දින ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්වී ප්‍රතිකාර ලැබීමෙන් පසු 2007.03.26 දින වෛද්‍ය මණ්ඩලයකට ඉදිරිපත් කිරීමට වගඋත්තර පාර්ශවය කටයුතු කර ඇති අතර, එම වෛද්‍ය මණ්ඩල නිර්දේශය වී ඇත්තේ, මෙම පැමිණිලිකරුගේ දුබලතා ප්‍රතිශතය 40% ක් බවත් වයස අවුරුදු 55 වන තෙක් වැටුප් හා දීමනා හිමි ගැන්විය යුතු බවත්ය. එසේ වුවද මෙම නිලධාරියාව විශ්‍රාම ගන්වන අවස්ථාවේදී වයස අවුරුදු 55 ඉක්මවා සිටි බැවින් වැටුප් හා දීමනා හිමි ගැන්වීමට පවතින විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැති බවත් දුබලතා ප්‍රතිශතය අනුව රු.40,000/- ක වන්දි මුදලක් හා ඊට අදාළ වැටුප් හිමිකම් හිමිගැන්වීමට කටයුතු කළ බවත් මෙහි පළමු වගඋත්තරකරුගේ 2017.06.09 දිනැති වාර්තාවට අනුව සනාථ වේ. නමුත් එම වාර්තාවේදීම පැමිණිලිකරු දෙවන වරට වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් වීමෙන් පසු ඔහුගේ දුබලතා ප්‍රතිශතය 60% ක් දක්වා වැඩිකර ඊට අදාළ වන්දි මුදල් හා දීමනා සහිතව වයස අවුරුදු 55 දක්වා හිමි ගැන්වීමට නිර්දේශ වුවද වයස අවුරුදු 55 ඉක්මවූ නිලධාරියෙකු වෙත එසේ නැවත ගෙවීම් කළ නොහැකි බව දක්වා ඇත.

ඉහත කරුණු අනුව වගඋත්තරකාර පාර්ශවය මෙම පැමිණිලිකරු ඉදිරිපත් වූ පළමු වෛද්‍ය මණ්ඩල නිර්දේශය අනුව වයස අවුරුදු 55 ඉක්මවා තිබියදීත් දුබලතා ප්‍රතිශතය 40% ක් හා ඊට අදාළ වැටුප් හා දීමනා ගෙවීමට කටයුතු කර තිබියදී නැවත දුබලතා ප්‍රතිශතය 60% ක්වූ පසු වයස 55 ඉක්මවීම මත ගෙවීම් කිරීමට නොහැකි බව ප්‍රකාශ කිරීම අතර, පරස්පරතාවයක් පවතින බව නිරීක්ෂණය වේ.

දෙවනවර වෛද්‍ය මණ්ඩලයක් වෙත පැමිණිලිකරු ඉදිරිපත්වීම හුදෙක්ම පැමිණිලිකරුගේ ඉල්ලීම මත සිදුවූවක් බවත් මෙහිදී පැමිණිලිකරුගේ වයස පිළිබඳව දෙවනවර පිහිට වූ වෛද්‍ය මණ්ඩලය සැලකිළිමත් වී නොමැති බවත් පළමු වගඋත්තරකරු කියා සිටියද පැමිණිලිකරුට පසුකාලීනව ඇතිවූ ශාරීරික දුබලතා නිසා යුද්ධ හමුදාපති වෙතින් කරන ලද අභියාචනයකට අනුව යුධ හමුදාපතිගේම නියෝගයක් මත මේ ආකාරයෙන් දෙවනවරට පැමිණිලිකරුව වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කිරීම සිදුවී ඇති බව ලිඛිත සාක්ෂි අනුව සනාථ වේ. එසේම පැමිණිලිකරු තුවාල ලැබූ අවස්ථාවේ යුධ හමුදාව විසින් නිකුත් කර ඇති "හදිසි හෝ තමා විසින්ම කරගත් තුවාල පිළිබඳ වාර්තාවේ" 03 වන හා 05 වන කොටස් යටතේ මෙම ප්‍රහාරයෙන් සිදුවී ඇති තුවාල අනාගතයට බලපාන බව දක්වා ඇති බවද නිරීක්ෂණය වේ. මේ අනුව පැමිණිලිකරු යුධ හමුදාපති වෙතින් තමාගේ ශාරීරික දුබලතාව පිළිබඳ නැවත සලකා බලන ලෙස

අභියාචනයක් ඉදිරිපත් කිරීම සාධාරණ හේතු මත සිදුවී ඇති බව අනාවරණය වේ. එසේම මේ ආකාරයෙන් දෙවනවරට වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත්වීම නීත්‍යානුකූල නොවන බව තහවුරු කිරීමට නීතිමය ප්‍රතිපාදන ඇති බවට වගඋත්තරකාර පාර්ශවය කරුණු ඉදිරිපත් නොකරයි.

දෙවන වරට ඉදිරිපත් වූ වෛද්‍ය මණ්ඩල නිර්දේශය අනුව පැමිණිලිකරු වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන අවස්ථාවේදි ඔහු විශ්‍රාමික නිලධාරියෙකු බවට වගඋත්තරකාර පාර්ශවය සත්භාවයෙන්ම දැන සිටි බව වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම පැමිණිලිකරුට යොමුකර ඇති 2013.10.03 දිනැතිව යවන ලද ලිපිය අනුව සනාථ වේ.

දෙවනවරට පවත්වන ලද වෛද්‍ය මණ්ඩලය සඳහා සාමාජිකයින් තිදෙනෙකු සම්බන්ධ වී තිබූ අතර ඔවුන් තිදෙනා විසින්ම අත්සන් යොදා මෙම පැමිණිලිකරුට 60% දුබලතා ප්‍රතිශතයක් හිමිවිය යුතු බවට 2014.04.30 දින නිර්දේශ කර ඇති බව නිරීක්ෂණය වේ. වගඋත්තරකාර පාර්ශවය එම දෙවනවරට පවත්වන ලද වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුව 2014 ඔක්තෝම්බර් (දිනය පැහැදිලි නැත) ලිපිය මගින් මෙම පැමිණිලිකරුට රු. 60,000/- ක් වන්දි මුදලක් හිමි බවට යුද්ධ හමුදා මූලස්ථානය මඟින් ලිපියක්ද යොමු කර ඇත.

මේ අනුව පළමු වගඋත්තරකාර පාර්ශවය පැමිණිලිකරුට යුද හමුදාපතිගේ නියමයෙන් පවත්වන ලද දෙවනවර වෛද්‍ය මණ්ඩල නිර්දේශය අනුව දුබලතා ප්‍රතිශතය 60% ලෙස සලකා කටයුතු නොකිරීමට ඉදිරිපත් කර සිටින. ඒ වන විට පැමිණිලිකරුගේ වයස 55 ඉක්මවා තිබීම හා යුද්ධ හමුදාපති නියමයෙන් පත්කරන ලද වෛද්‍ය මණ්ඩලය මෙම පැමිණිලිකරුව දෙවන වරට පරීක්ෂා කිරීමේදී ඔහුගේ වයස පිළිබඳ සැලකිළිමත් වී නොමැති බවට ඉදිරිපත් කරන කරුණු සාධාරණ බවට කරුණු අනාවරණය නොවේ. යුධ හමුදාපති දෙවනවරට වෛද්‍ය මණ්ඩලයක් වෙත පැමිණිලිකරුව ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබූ ආකාරය හා දෙවන වෛද්‍ය මණ්ඩල නිර්දේශය නීත්‍යානුකූලව සිදුකර ඇති බව අදාළ ලිඛිත සාක්ෂි අනුව ද සනාථ වේ. එසේම දෙවනවරට වැඩිකළ දුබලතා ප්‍රතිශතයට අනුව දුබලතා විශ්‍රාම වැටුප් හා වන්දි මුදල් හිමිගැන්වීමට යුධ හමුදා වැටුප් හා දීමනා හිමි ගැන්වීමේ විධිවිධාන තුළ නීතිමය ප්‍රතිපාදන නොමැති බව පළමු වගඋත්තරකරු කියා සිටියද අදාළ ගෙවීම් නොකර සිටීමට බලපාන නීතිමය විධිවිධාන ඇති බවටද කරුණු ඉදිරිපත් නොකරයි.

මේ අනුව දෙවන වගඋත්තරකරු වන යුධ හමුදාපති නියමයෙන් පවත්වන ලද වෛද්‍ය මණ්ඩල නිර්දේශය අනුව පළමු වගඋත්තරකරු වන වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ කටයුතු නොකර සිටීම තුළින් පැමිණිලිකරු වෙත 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කර ඇති නීතිය

පසිදලීම හා ක්‍රියාත්මක කිරීමද නීතියේ ඍකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය යන්න උල්ලංඝනය කිරීමක් බව මෙම පරීක්ෂණයෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශ ඃ-**

1. මේ අනුව දෙවන වෛද්‍ය මණ්ඩල නිර්දේශ අනුව පැමිණිලිකරුගේ දුබලතා ප්‍රතිශතය 60% ක් වීම නිසා හිමි වූ රු. 60,000/- ක වන්දිය නීත්‍යානුකූල බවටත් ඒ අනුව දැනටමත් ගෙවා ඇති රු. 40,000/- ක වන්දි මුදල හැරුණු විට ඉතිරි රු.20,000/- ක හිඟ වන්දි මුදල මෙහි පළමු වගඋත්තරකාර පාර්ශවය වන වැටුප් හා ලේඛන අධ්‍යක්ෂ විසින් පැමිණිලිකරු වෙත ගෙවන ලෙසටත් ඊට අදාළව 1981 යුද හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සංග්‍රහයේ 19(1) (අ) වගන්තියට අනුව ඉපයීමේ ශක්තිය නැතිවීමේ ප්‍රතිශතය 60% ක් වීම නිසා හිටපු මේජර්වරයෙකුට හිමිවිය යුතු ස්ථිර දුබලතා විශ්‍රාම වැටුප වන රු.2000/- වන මුදල හිමි ගැන්වීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2. එසේම යුදමය වාතාවරණය තුළ ආබාධිත තත්ත්වයට පත්වූ මෙවැනි සෙබලුන් හට තමන්ගේ ආබාධිත තත්ත්වය නිසා පසුකාලීනව ඇතිවන ශාරීරික හා මානසික දුබලතා පදනම් කරගෙන නැවත වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් වීමට හා එම වෛද්‍ය මණ්ඩල නිර්දේශයන්ට යටත්ව සහන ලබාගැනීමට අවශ්‍ය නීතිමය විධිවිධාන මීට වඩා පුළුල් කිරීමට මෙහි දෙවන වගඋත්තරකරු වන යුධ හමුදාපතිගේ අවධානය යොමු කිරීම සුදුසු වන බවටත් යෝජනා කර සිටිමු.

2019. 06 - 21 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රිත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දිම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වා සිටිමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

B/R

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.